# හදිසි ආපදා අවස්ථාවන්හිදී මව්කිරි ළදරුවන්ට ඉහලම ආරක්ෂාව ලබාදෙයි

## Breastfeeding provides the best protection for infants in emergencies

**2017 මැයි 31. කොළඹ.** සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF), දැනට පවතින ගංවතුර සහ නායයෑම් ආපදා තත්ත්වයන් යටතේදී ළදරුවන්ට මව්කිරිදීම නොකඩවා පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පිළිබඳව සියළුම වගකිවයුතු පාර්ශ්වයන්ට අවධානයෙන් සිටින ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර ළදරු කිරිපිටි හා අනෙකුත් කිරිපිටි වර්ග පිළිබඳව සහ අනවශ්‍ය හා සෞඛ්‍යයට තර්ජනයක් වියහැකි එවැනි ප්‍රදානයන් පිළිබඳව ප්‍රවේශම් වීමටත් දන්වා සිටියි.

ආහාර සැපයීම හා ආරක්ෂිත පානීය ජල සැපයුම ඉතාමත්ම සීමාසහිත වන මෙවැනි හදිසි ආපදා අවස්ථාවන්හිදී ආපදා ප්‍රදේශයන්හි සිටින ළදරුවන් හා කුඩා දරුවන් පාචනය සහ අනෙකුත් රෝග තත්ත්වයන්ට ගොදුරු වීමේ දැඩි අවදානමක් ඇත. මව්කිරි මගින් දරුවන් ලෙඩරෝගවලින් ආරක්ෂාකළ හැකි අත්‍යවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ හා ප්‍රතිශක්තිය සපයනු ලැබේ. මව්කිරි නොලබන දරුවන් මව්කිරි ලබන දරුවන්ට වඩා සෞඛ්‍ය ගැටළු ඇතිවීමට වැඩි අවදානමක් දක්වයි. එමනිසා හදිසි ආපදා තත්ත්වයට බඳුන්වූ සියළුම මව්කිරිදෙන මව්වරුන්ට මව්කිරි දීම දිගටම පවත්වා ගැනීම සඳහා දියයුතු උපරිම සහාය ලබාදීමට සෑම උත්සාහයක්ම දැරිය යුතුය.

මාස 6 වනතෙක් සියළුම ළදරුවන්ට මව්කිරි පමණක්ම ලබාදියයුතු වන අතර ආපදා අවස්ථාවන්හිදීත් මෙය එලෙසම ක්‍රියාත්මක විය යුතුය. ඉන්පසු වයස අවුරුදු 2 දක්වා දරුවන්ට ජාතික නිර්දේශයන්ට අනුකූලව ආරක්ෂිත හා ප්‍රමාණවත් අමතර ආහාර සමග මව්කිරි දීම දිගටම පවත්වාගත යුතුය. ළදරු කිරිපිටි වර්ග ලබන දරුවන් පාචන රෝග තත්ත්වයන්ට හා මරණයට පත්වීමේ ඉතා වැඩි අවදානමකට අනිවාර්යයයෙන්ම මුහුණ දෙන නිසා හදිසි ආපදා අවස්ථාවන්හිදී ළදරුවන්ට කිරිපිටි ලබාදීම ආපදා තත්ත්වය දෙගුණ කිරීමක් ලෙස සැලකිය හැකිය.

"මෙම ආපදා අවස්ථාවෙහි අප විශාල අභියෝගයකට මුහුණ පා සිටින අතර මෙවැනි තත්ත්වයක් තුල දරුවන්ගේ රෝගී වීමේ අවදානමක් ඇති වේ. එමනිසා මව්කිරිදීම පවත්වාගෙන යාම ළදරුවන්ගේ සහ කුඩා දරුවන්ගේ සෞඛ්‍ය සංරක්ෂණය සඳහා තීරණාත්මක සාධකයක් වී ඇත" සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැඩබලන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වෛද්‍ය සරත් අමුණුගම මහතා පැවසීය.

පිරිසිදු ජලය, පිරිසිදු භාජන සහ ජලය උණු කිරීම/භාජන තම්බා ගැනීම සඳහා පහසුකම් නොමැති ආපදා අවස්ථාවලදී ළදරු කිරි වර්ග හා අනෙකුත් කිරි වර්ග පිළියෙල කරගැනීමේදී ඇති අවදානම, මව්කිරි නොලබන දරුවන්ගේ රෝග වැළඳීමේ අවදානම තව තවත් වැඩි කරවයි. මෙවැනි අවස්ථාවලදී ළදරු කිරිපිටි වර්ග හා අනෙකුත් කිරිපිටි ප්‍රදානයන් නිසා ආසාදන, පාචන රෝග හා දරුණු සංකූලතා ඇතිවීම සම්බන්ධයෙන් දරුවන් මුහුණ පාන අවදානම වැඩි වෙයි. එමනිසා හදිසි ආපදා අවස්ථාවලදී ළදරු කිරිපිටි වර්ග හා අනෙකුත් කිරිපිටි වර්ග ප්‍රදානය කිරීමෙන් වැලකියයුතුය. අවශ්‍ය අවස්ථාවලදී එනම් මව්වරුන් අහිමි වූ ළදරුවන් සිටින විට ඔවුන්ගේ ළදරු කිරිපිටි අවශ්‍යතාවය සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හෝ පළාත්/දිස්ත්‍රික් සෞඛ්‍ය බලධාරීන් විසින් සැපයෙනු ඇත.

ගංවතුර සහ නායයෑම් ආපදාවෙන් පසු අප මුහුණපා සිටින මෙම දුෂ්කර අවස්ථාවේදී ළදරුවන්ට හා දරුවන්ට අප ලබා දියයුතු වටිනාම දේ කුමක්ද යන්න පිළිබඳව සිහියේ තබාගැනීමත් මව්කිරි දීම නොකඩවා සිදු කිරීමට හා ආරක්ෂිත අමතර ආහාර ලබාදීම සඳහා මව්වරුන් උනන්දු කෙරෙන වටාපිටාවක් ඇති කිරීමත් ඉතා වැදගත් බව යළි අවධාරනය කරමු.

**මේ පිළිබඳව වැඩිදුර තොරතුරු සඳහා සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පවුල් සෞඛ්‍ය කාර්යාංශය අමතන්න 0112 693934 / 0112 699149**

Ministry of Health,
Nutrition & Indigenous Medicine